පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 07 |

# තෙවන වාර පරීක්ෂණය - 2023
# පෙරදිග සංගීතය I, II

පාසලේ නම : ......................................................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය පැය 02

## I කොටස

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **ප්‍රශ්න අංක 01 සිට 10 දක්වා දී ඇති පිළිතුරු අතුරින් වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. සප්තකයේ ඇති අචල ස්වර දෙක කුමක් ද?
(1) ස , ප (2) ස , ම (3) ම , ප (4) ග , ම

02. සප්තකයක කෝමල හා තීව්‍ර ස්වරවල එකතුව,
(1) දෙකකි. (2) තුනකි. (3) හතරකි. (4) පහකි.

03. පහත දැක්වෙන ගීත අතුරින් ස්වරස්ථාපන ගීතයක් නොවන්නේ,
(1) ඈත ඈදී යලි මැතට පාවේ (2) බැතිනා සිරිපා කරුණා කරනා
(3) කඳුපෙළ අතරේ තුරු වදුලේ (4) කටු අකුලේ මල් ඇහැරේ

04. <u>ධ</u> , ම´ , ප̇ යන ස්වර සංකේතයන්හි නිවැරදි ස්වර නාමයන් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) ශුද්ධ ධෛවතය, තීව්‍ර මධ්‍යමය, ශුද්ධ පංචමය
(2) කෝමල ධෛවතය, තීව්‍ර මධ්‍යමය, උච්ච පංචමය
(3) කෝමල ධෛවතය, තීව්‍ර මධ්‍යමය, මන්ද්‍ර පංචමය
(4) කෝමල ධෛවතය, ශුද්ධ මධ්‍යමය, ශුද්ධ පංචමය

05. ස්වර පුවරු වාදන භාණ්ඩයක් නොවන්නේ මින් කුමක් ද?
(1) එකෝඩිනය (2) මවුත් ඕගනය
(3) සර්පිනාව (4) පියානෝව

06. ස රි , ස ග ම ග , රි ග , රි ම ප ම ................. යන ස්වර අභ්‍යාසයේ ඊළඟ පියවර වනුයේ,
(1) ග ම , ග ප ධ ප (2) ග ම, ග ම ප ම
(3) ග ප , ග ප ධ ප (4) ග ම, ග ප ප ධ

07. | ධ ගෙ | න ති | න ක| ධි න| යනු,
(1) කෙහෙර්වා තාලයයි. (2) ත්‍රිතාලයයි.
(3) ලාවනී තාලයයි. (4) දාදරා තාලයයි.

08 දාදරා තාලයට සමාන දේශීය තිත් රූපය වන්නේ,
(1) සුළු තනි තිතයි. (2) මැදුම් තනි තිතයි.
(3) සුළු මැදුම් දෙතිතයි. (4) මහ තනි තිතයි.

09. "Doe a deer (ඩෝ අ ඩියර්)" නම් ගීතය අයත් චිත්‍රපටය වන්නේ,
(1) Jungle beat (ජන්ගල් බීට්)
(2) Alvin and the chipmunks (ඇල්වින් ඇන්ඩ් ද චිප්මන්ක්ස්)
(3) Scooby doo (ස්කූබි ඩූ)
(4) Sound of Music (සවුන්ඩ් ඔෆ් මියුසික්)

10. නූර්ති ගීත සඳහා ආභාසය ලැබූ සංගීත සම්ප්‍රදාය වන්නේ,
   (1) බටහිර සංගීත සම්ප්‍රදාය.   (2) කර්ණාටක සංගීත සම්ප්‍රදාය.
   (3) හින්දුස්තානි සංගීත සම්ප්‍රදාය.   (4) දේශීය සංගීත සම්ප්‍රදාය.

- **ප්‍රශ්න අංක 11 - 15 දක්වා ප්‍රශ්න සඳහා ගැළපෙන පිළිතුර තෝරා තිත් ඉරි මත ලියන්න.**

| මිස්රාබ් / දැල් ගී / ළමා ගී / ගී අනුවාදනය / කෝලම් |
|---|

11. සරල නාද මාලාවන්ගෙන් හා සරල පද මාලාවන්ගෙන් යුක්ත, ගුවන් විදුලියෙන් ප්‍රචාරය වන ගීත, ............................................. වේ.

12. අර්ථ විරහිත පද යොදා ගනිමින් ධීවරයන් විසින් ගයන ගීත විශේෂය ........................................... නම් වේ.

13. ගායනයෙන් තොරව ගීතයේ නාද මාලාව වාදනය කිරීම ............................................. නම් වේ.

14. සිතාරය වාදනය කිරීම සඳහා ............................................. නම් උපකරණය භාවිත කරයි.

15. ''පෙර සිට පැවැත එන'' ගීතය ............................................. නාට්‍යයේ එන ගීතයකි.

- **ප්‍රශ්න අංක 16 - 20 දක්වා දී ඇත වාක්‍ය නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද වරහන් තුළ යොදන්න.**

16. කෝලම් ගීත ගායනයේ දී පසුතරට බෙරය වාදනය කරයි. (   )

17. ජසයා, ලෙන්චිනා, මුදලි කෝලම් නාට්‍යයේ එන චරිත වේ. (   )

18. ලඝු අකුරක වටිනාකම මාත්‍රා දෙකකි. (   )

19. දවුල ආතත ගණයට අයත් භාණ්ඩයකි. (   )

20. '' දම්වැසි වස්සන ලෝකේ'' ගීතය විදුර නූර්තියේ එන ගීතයකි. (   )

**(ලකුණු 02×20=40)**

## II කොටස

- තෝරා ගත් ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

**01.**

(i) ත්‍රිවිධ සප්තකවල ස්වර වෙන් වෙන්ව ලියා දක්වන්න. **(ලකුණු 06)**

(ii) ස්වර පුවරුවක රූප සටහනක් ඇඳ, ඒ මත මධ්‍ය සප්තකයේ කෝමළ හා තීව්‍ර ස්වර ලකුණු කරන්න. **(ලකුණු 06)**

**02.** ඔබගේ විෂය නිර්දේශයට අයත් ගීත වර්ග සහ ගී පාද කිහිපයක් පහත දක්වා ඇත.

| | "අ" තීරුව | | | "ආ" තීරුව |
|---|---|---|---|---|
| 1 | ළමා ගී | ( ) | A | ගම්භීර කාලිංග නුවර |
| 2 | උපදේශාත්මක ගී | ( ) | B | අතට වෙරලු ඇහිඳ ගෙනේ |
| 3 | දරු නැළවිලි ගී | ( ) | C | ඉරෙන් හඳෙන් එළිය අරන් |
| 4 | රබන් ගී | ( ) | D | දන්න වංහුං අප |
| 5 | කෝලම් ගී | ( ) | E | පාන් කිරිත්තා තක්කිට තරිකිට |
| 6 | නූර්ති ගී | ( ) | F | සඳුන් කොකුම් මොරසුගාන |

(i) ඉහත වගුවේ **"අ" තීරුවේ** හිස්තැනට සුදුසු ගී පාදයේ අක්ෂරය **"ආ" තීරුවෙන්** තෝරා ලියන්න. **(ලකුණු 06)**

(ii) "F" ගී වර්ගය ගායනා කරන අවස්ථා **දෙකක්** ලියන්න. **(ලකුණු 02)**

(iii) "D" ගී වර්ගය සඳහා යොදා ගන්නා සංගීත භාණ්ඩ **දෙකක්** නම් කරන්න. **(ලකුණු 02)**

(iv) කෝලම් නාට්‍යවල දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ **දෙකක්** ලියන්න. **(ලකුණු 02)**

**03.**

(i) තනි තිතේ ප්‍රභේද කීය ද? **(ලකුණු 01)**

(ii) ඒවා නම් කරන්න. **(ලකුණු 03)**

(iii) එම තිත්වලට සමාන හින්දුස්ථානි තාල නම් කරන්න. **(ලකුණු 03)**

(iv) මාත්‍රා 4 න් 4 ට විභාග වන හින්දුස්ථානි තාලය නිවැරදිව ප්‍රස්තාර කරන්න. **(ලකුණු 05)**

**04.**

(i) පහත සඳහන් ස්වර රටා අතුරින් **<u>දෙකක්</u>** උච්ච සඩ්ජය දක්වා ආරෝහණ රටාවට ලියන්න.

A. ස රි , ස රි <u>ග</u> , රි <u>ග</u> , රි <u>ග</u> ම
B. ස ග රි ස , රි ම ග රි
C. ස රි ග ස , රි ග ම රි
D. ස රි ග ම , රි ග ම ප **(ලකුණු 04)**

(ii) ඔබ උගත් ස්වරස්ථාපන ගීතයක් ගීත ස්වර ප්‍රස්තාර කරන්න. **(ලකුණු 06)**

(iii) ස්වරස්ථාපන ගීත ඉගෙනීමෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන **දෙකක්** සඳහන් කරන්න. **(ලකුණු 02)**

**05.** සංගීත විෂයට අනුව ග්‍රහ යනු **"ග්‍රහණය කර ගැනීම හෙවත් අල්ලා ගැනීමයි."** ගීත ගායනයේ දී හෝ වාදනයේ දී ග්‍රහ වර්ග **තුනකට** බෙදා දක්වන බව ඔබ පන්ති කාමරයේ දී ඉගෙන ගෙන ඇත. ඒ අනුව,

(i) ග්‍රහ වර්ග **තුන** නම් කරන්න. **(ලකුණු 03)**

(ii) එක් එක් ග්‍රහ වර්ගයට උදාහරණ ගී පාදය බැගින් ලියන්න. **(ලකුණු 03)**

(iii) ඉන් ඔබ කැමති ග්‍රහ වර්ග **දෙකක්** කෙටියෙන් හඳුන්වන්න. **(ලකුණු 06)**

**06.**


(i) ඔබ උගත් දේශාභිමානී ගීයක් සම්පූර්ණයෙන් ලියා දක්වන්න. **(ලකුණු 06)**

(ii) **"දේශාභිමානී ගීත"** යන්න කෙටියෙන් හඳුන්වන්න. **(ලකුණු 03)**

(iii) ඔබ උගත් උපදේශාත්මක ගීයක ස්ථායි කොටස ලියා දක්වන්න. **(ලකුණු 03)**

**07.**

(i) පහත දැක්වෙන ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.



**හරහට**

1. ස්වර හතට කියන තවත් නමකි
5. ස්වර පුවරු භාණ්ඩවල ස්වර, මේ නමින් ද හඳුන්වනු ලබයි.
7. සංගීතයේ මාධ්‍ය
8. තාලයේ වේගය
9. වයලීනයට කියන තවත් නමකි.

**පහළට**

1. හාර්මෝනියම් නම් සංගීත භාණ්ඩය හඳුන්වන තවත් නමකි.
2. බොහෝ ගීත සඳහා තාලවාද්‍ය භාණ්ඩයක් ලෙස භාවිත කරයි.
3. සාමාජිකයන් හතර දෙනෙකුගෙන් සමන්විත තත් භාණ්ඩ පවුලේ කුඩාම සාමාජිකයා වන්නේ,
4. වර්ණයකි.
6. පහතරට බෙරය හඳුන්වන තවත් නමකි.

**(ලකුණු 10)**

(ii) ප්‍රහේලිකා පිරවීමෙන් ඔබට ලැබෙන දැනුම කවරේදැයි කරුණු **දෙකකින්** ලියා දක්වන්න. **(ලකුණු 02)**

★★★★

# 7 ශ්‍රේණිය - පෙරදිග සංගීතය
## පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | 1 | 06. | 1 | 11. | ළමා ගීත | 16. | ✓ |
| 02. | 4 | 07. | 3 | 12. | දැල් ගීත | 17. | ✓ |
| 03. | 4 | 08. | 2 | 13. | ගී අනුවාදනය | 18. | × |
| 04. | 2 | 09. | 4 | 14. | මිස්රාබ් | 19. | × |
| 05. | 2 | 10. | 3 | 15. | කෝලම් | 20. | ✓ |


**(ලකුණු 02×20=40)**

## II කොටස

**01.**

(i) මන්ද්‍ර සප්තකය - ස රි ග ම ප ධ නි (dots below)
මධ්‍ය සප්තකය - ස රි ග ම ප ධ නි
උච්ච සප්තකය - ස රි ග ම ප ධ නි (dots above) **(ලකුණු 06)**

(ii)




**(ලකුණු 06)**

**02.**

(i) 1 (C)
2 (E)
3 (B)
4 (F)
5 (A)
6 (D) **(ලකුණු 06)**

ii) F ගී වර්ගය - රබන් ගී
විවාහ මංගල උත්සව/ අලුත් අවුරුදු උත්සව/
දරුවෙකු වැඩිවියට පැමිණෙන උත්සවවලදී ආදී වශයෙන් **(ලකුණු 02)**

(iii) D ගී වර්ගය - නූර්ති ගී
තබ්ලාව/ සර්පිනාව/වයලීනය/ බටනලාව **(ලකුණු 02)**

(iv) පහතරට සම්ප්‍රදායේ ගැමි නාට්‍ය විශේෂයක් වීම / වෙස් මුහුණු පළදා රංගනයේ යෙදීම / පුරුෂ පක්ෂය පමණක් රංගනයේ යෙදීම / හාස්‍ය ජනක නාට්‍ය විශේෂයක් වීම
**(ලකුණු 02)**

**03.**

(i) 3 යි **(ලකුණු 01)**

(ii) සුළු තනි තිත/ මැදුම් තනි තිත/ මහ තනි තිත **(ලකුණු 03)**

(iii) සුළු තනි තිත - ලාවනී තාලය
මැදුම් තනි තිත - දාදර තාලය
මහ තනි තිත - කෙහෙර්වා තාලය / ත්‍රිතාලය **(ලකුණු 03)**

(iv) කෙහෙර්වා / ත්‍රිතාල් ප්‍රස්ථාර කිරිමට නිවැරදි තාල සංඥා සමග **(ලකුණු 05)**

**04.**

(i) ස්වර අභ්‍යාස දෙකට 2 බැගින් **(ලකුණු 04)**

(ii) ස්වරස්ථාපන ගීතය ගීත ස්වර ප්‍රස්තාර කිරීමට **(ලකුණු 06)**

(iii) ස්වරඥානය ලැබීම / ගායනය පහසුවීම/ වාදනය පුහුණුව ලැබීම / ස්වර රටා හඳුනා ගැනීම
**(ලකුණු 02)**

**05.**

(i) සම ග්‍රහ / අව ග්‍රහ / විෂම ග්‍රහ **(ලකුණු 03)**

(ii) සම ග්‍රහ - ලංකා ලංකා පෙම්බර ලංකා / මිහිකත නලවාලා
අව ග්‍රහ - සසර වසන තුරු / දන්නෝ බුදුන්ගේ
විෂම ග්‍රහ - දුර පෙනෙන තැනිතලා / හෙළ ජාතික අභිමානේ ගීත වලින් එක බැගින් **(ලකුණු 03)**

**06.**

(i) දේශාභිමානී ගීයට **(ලකුණු 06)**
(ii) දේශාභිමානී ගීතය කෙටියෙන් හැඳින්වීම
(iii) උපදේශාත්මක ගීයේ ස්ථායි කොටසට **(ලකුණු 02)**

**07.**

(i)

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1. ස | ප් | 2. ත | ස් | 3. ව | 4. ර | |
| ර් | | බ් | | 5. ය | තු | 6. රු |
| පි | | ලා | | ලී | | හු |
| 7. නා | ද | | | න | | ණු |
| ව | | | 8. ල | ය | | බෙ |
| | | | | | | ර |
| | 9. ර | වි | කි | ඤ් | ඤ | ය |

**(ලකුණු 10)**

(ii) කරුණු දෙකට **(ලකුණු 02)**


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
ශිෂ්‍යත්ව
2013 - 2022
ඉතිහාසය
2014 - 2023
2024
O/L
Akura Pilot
NEW SYLLABUS
සංගීතය
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න